# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.14 පැය 2325 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/737/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

**01. මනුෂ්‍ය ඝාතනයකට අවශය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - වැල්ලවාය පොලිස් වසම.**

2025.03.14 වන අද දින අළුයම් කාලයේ වැල්ලවාය පොලිස් වසමේ රණවරාව හන්දියේ බස්නැවතුම් පොල අසලදී පහරදී පුද්ගලයෙකු ඝාතනය කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් වැල්ලවාය පොලිස් ස්ථානය මඟින් විමශර්න ආරම්භ කර තිබූ අතර මෙම ඝාතනය සම්බන්ධයෙන් සැකකරුවෙකු අද දින උදෑසන කාලයේදී රණවරාව ප්‍රදේශයේදී වැල්ලවාය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 23 ක් වූ රන්දෙනිය, වැල්ලවාය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැල්ලවාය පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**02. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - වැලිකන්ද පොලිස් වසම.**

2025.04.14 වන දින සවස් කාලයේ වැලිකන්ද පොලිස් වසමේ සිංහපුර ප්‍රදේශයේ ඉෂඩ් ඕ ඇළට වැටී දියේ ගිලී පුද්ගලයෙකු මියගොස් ඇති බවට වැලිකන්ද පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්නයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 62 ක් වූ ගල්ලෑල්ල, පොළොන්නරුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු සෙවනපිටිය දෙස සිට සිංහපුර දෙසට ඇළ ඉවුර අසලින් වැටී ඇති පටු මාගර්යේ යතුරුපැදියකින් ගමන් කරමින් සිටියදී යතුරුපැදිය ඇල ඉවුරට පෙරලී පැදිකරු ඇළට වැටීමෙන් දියේ ගිලි මියගොස් ඇති බවට විමශර්නයේදී අනාවරණයවී ඇත. මෘත ශරීරය පොළොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වැලිකන්ද පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**03. නිවසේ උඩුමහලින් වැටී පුද්ගලයෙකු මියයාම - මහවෙල පොලිස් වසම**

2025.04.14 වන දින අළුයම් කාලයේ මහවෙල පොලිස් වසමේ තල්ගහකොටුව ප්‍රදේශයේ නිවසක උඩු මහලින් ඇද වැටී පුද්ගලයෙකු මියගොස් ඇති බවට ලද පණිවිඩයක් මත මහවෙල පොලිසිය විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ තල්ගහකොටුව, මඩවල උල්පත ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මරණකරු සිය පවුලේ සාමාජිකයන් සමඟ අළුත් අවුරුදු දිනයේ නැකැත් චාරිත්‍ර ඉටුකිරීම සඳහා සූදානම් වෙමින් සිටින අතර තුර නිවසේ උඩුමහලේ අඩක් නිම කළ ස්ථානයකින් පහලට වැටී මෙලෙස මියසේ ඇති බවට විමශර්නයේදී අනාවරණය වි ඇත. මහවෙල පොලිස් ස්ථානය විසින් වැඩිදුර විමශර්න සිදු කර ගෙන යනු ලබයි.

## 04. මෙරට නිෂ්පාදිත ගිනි අවි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වාරියපොල පොලිස් ස්ථානය.

2025.04.14 වන දින දහවල් කාලයේ වාරියපොල පොලිස් වසමේ මැල්ලපොත්ත ප්‍රදේශයේදී වාරියපොල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 45 ක් වන මිනුවන්ගැටේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාරියපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය.

2025.04.14 වන දින සවස් කාලයේ මෝදර පොලිස් වසමේ බෝගස් හන්දිය අසලදී කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 150 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මෝදර පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 34 ක් වන මෝරුපොල, ගම්පහ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෝදර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - කුලියාපිටිය පොලිස් වසම.

2025.04.14 වන අද දින දහවල් කාලයේ කුලියාපිටිය පොලිස් වසමේ කුඹුක්කොටුව ගණන්ගමුව අතුරු මාර්ගයේ පන්සල් හන්දිය ආසන්නයේදී ගණන්ගමුව දෙස සිට කුඹුක්කොටුව දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාර්ගයේ පෙරළීගොස් ඇත. ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරු පැදියක් මෙම යතුරු පැදිය පෙරළී යන ආකාරය දැක මාර්ගයේ නතර කර ඇති අතර මාර්ගයේ ඇදී ආ යතුරු පැදිය එම යතුරු පැදියේ ද ගැටී වැටක ද ගැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු, පසු පැදිකරු හා ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරු පැදියේ පැදිකරු, පසුපැදිකාරිය හා කුඩා දරුවෙකු ද තුවාල ලබා කුලියාපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පෙරළී ගිය යතුරු පැදියේ පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 22 ක් වූ කුඹුක්කොටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කුලියාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කුලියාපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**